**බිබිල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත්කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජුනි 26 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ඉදිකරන ලද ජල පිරිපහදුවේ වටිනාකම ගිණුම්ගත කිරීමේදී රු.3,785,870ක එකතු කල අගය මත බදු වටිනාකමද ප්‍රාග්ධනිතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඉදිකරන ලද රු.103,452ක් වූ පෙරටු කාර්යාලයේ වටිනාකම ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඇ) බිබිල මහජන පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් බවට පත් කිරීමට අවශ්‍ය උපකරණ මිලදීගැනීම වෙනුවෙන් ලද රු.900,000ක් පොදු තැන්පත් ගිණුමට බැරකර අදාල වියදම් දරා තිබුණු නමුත් පොදු තැන්පත් ගිණුමෙන් ඉවත්කර ප්‍රාග්ධන ආධාර ගිණුමට බැරකර නොතිබුණි.

(ඈ) කණවේගල්ල පටුපාන ඔය හරහා කෝස්වුවක් ඉදිකිරීමේ කර්මාන්තයට අදාලව 2015 සහ 2016 වර්ෂවලදී ලැබුණු එකතුව රු.1,986,637ක් පොදු තැන්පත් ගිණුමට බැරකර අදාල වියදම් දරා තිබුණු නමුත් පොදු තැන්පත් ගිණුමෙන් ඉවත්කර ප්‍රාග්ධන ආධාර ගිණුමට බැරකර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහනට අදාලව ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.551,895ක් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) ගොඩනැගිලි හා සවිකිරීම් සඳහා දරන ලද රු.294,480ක් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් සහ ආධාර ලෙස ලැබුණු රු.308,065ක් වටිනා කාර්යාල උපකරණ, ලි බඩු හා සවිකිරීම් ප්‍රාග්ධනිතකර නොතිබුණි.

(ඌ) ස්ථාවර නියෝග අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවා තිබුණු රු.2,062,120ක් වියදම් ණයහිමි ගිණුමට බැරකර තිබීම නිසා වියදම් ණය හිමියෝ සහ මුදල් ශේෂය එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.120,000ක සහා ලේකම් දීමනාව ගිණුම්ගතකර නොතිබුණි.

(ඒ) ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු රු.497,750ක හිඟ කඩකාමර කුලී ගිණුම්ගත කිරීමේදී ලැබිය යුතු කඩකුලී යටතේ ගිණුම්ගතකර සමාලෝචිත වර්ෂයේ ආදායමට බැරකර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.2,137,770ක් වුවද, එය රු.6,759,229ක් ලෙස රු.4,621,459ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

**1.3.2 <u>නොසැසඳුණු ගිණුම්</u>**

ගිණුම් විෂයයන් 06කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.39,322,333ක් වූ අතර ලේඛන හා උපලේඛන අනුව ශේෂය රු.40,051,225ක් විය.

**1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

<u>ගෙවිය යුතු ගිණුම්</u>

(i) ගිවිසුම් අත්සන් කිරීමේදී අයකර තිබුණු රු.190,969ක මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතුකර නොතිබුණි.

(ii) දීර්ඝ කාලයක සිට පැවත එන රු.643,495ක් වූ ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

**1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.349,946,458ක වත්කම් විෂයයක් සහ එකතුව රු.4,917,193ක වගකීම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 <u>අනුකූල නොවීම්</u>**

<u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**</u>

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව</u> | <u>වටිනාකම රු.</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|---|
| (අ) <u>**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**</u> | | |
| (i) 139 වගන්තිය | - | වරිපනම් බදු පැනවීමකට යටත් යම් ගෙයක ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවෙනු පිණිස වාර වාර්තා කැඳවීමට කටයුතුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) 159 වගන්තිය | 7,539,424 | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම් අයකරගෙන නොතිබුණි. |
| (iii) 158,162 හා 163 වගන්ති | 4,445,237 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u> | | |
| (i) මු.රෙ. 103 හා 104 | - | 2014 වර්ෂයේ සිට සිදුවී තිබුණු වාහන අනතුරු 03ක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ii) මු.රෙ. 1645 | - | සභාව සතු එක් එක් වාහනය සඳහා සියළු විස්තර ඇතුලත් ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු වාහන 06ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 1985 මාර්තු 20 දිනැති අංක 08/01/38 දරන චක්‍රලේඛය | - | (i) සභා බලප්‍රදේශයේ සිදුකර තිබුණු ඉදිකිරීම් 04ක් සම්බන්ධයෙන් සැලසුම් කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.<br>(ii) සභාව විසින් 2014,2015 හා 2016 වර්ෂවල අනුමතකර තිබුණු ගොඩනැගිලි සැලසුම් අතුරින් සැලසුම්පත් 162ක් සඳහා අනුකූලතා සහතික නිකුත්කර නොතිබුණි. |
| (ඉ) පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 22/1988 දරන චක්‍රලේඛය | - | බදුදී තිබුණු කඩකාමර 131ක කුලිය තක්සේරුකර නොතිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.32,367,704ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,103,448ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 11,320,250 | 11,527,795 | 7,572,993 | 3,954,802 | 9,640,756 | 9,581,069 | 5,703,312 | 3,918,557 |
| (ii) | කුලී | 6,853,200 | 9,863,548 | 3,503,560 | 6,359,988 | 6,489,000 | 6,489,000 | 2,724,366 | 3,764,634 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 150,000 | 150,000 | 144,050 | 5,950 | 125,000 | 125,000 | 132,500 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,642,999 | 8,642,999 | 15,943,210 | - | 4,630,000 | 4,630,000 | 8,906,947 | - |
| | **එකතුව** | **26,966,449** | **30,184,342** | **27,163,813** | **10,320,740** | **20,884,756** | **20,825,069** | **17,467,125** | **7,683,191** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රුපියල් මිලියන 30.1ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසානවන විට රුපියල් මිලියන 27.1ක් රැස්කර තිබුණු අතර එය මුළු බිල්කළ වටිනාකමින් සියයට 90ක් විය.

#### 2.2.3 වරිපනම් හා බදු

(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.3,213,266ක් වූ වරිපනම් බදු ආදායමින් වර්ෂය අවසානවන විට රු.1,365,080ක් රැස්කර තිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 43ක් තරම් ඉතා අඩු අගයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු.5,566,870ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු.2,574,025ක් රැස්කර තිබුණි. ඒ අනුව හිඟ වරිපනම් බදු රැස්කිරීමේ ප්‍රතිශතය සියයට 46ක් තරම් ඉතා අඩු අගයක පැවතුණි.

**2.2.4** වෙනත් ආදායම්

(අ) ආයතන 03ක් විසින් සභා බලප්‍රදේශයේ විවිධ ස්ථානවල සවිකර තිබුණු ස්ථිර දැන්වීම් පුවරු 03ක් වෙනුවෙන් 2016 වර්ෂයේ සිට අයකරගත යුතු රු.52,500ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශය තුල පවත්වාගෙන යන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා නවාතැන් පොළවල් 03කින් සියයට 01ක බදු මුදල අයකරගෙන නොතිබුණි.

**2.2.5** උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,382,715ක් හා මුද්දර ගාස්තු රු. 4,983,655ක් විය.

**03.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනවන විටත් කාරණා 22ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ)** ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කර්තව්‍යයන් තීරණයකර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

**(ඇ)** ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/43 දරන 2013 ජුනි 28 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ඌව පළාත් සභා අතුරු ව්‍යවස්ථාව වැලඳ ගැනීමට කටයුතුකර තිබුණද, එහි 13 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාර කසළ බදු පනවා සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු කසළ කළමනාකරණ වියදම පියවාගෙන නොතිබුණි.

(ii) කසළ කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

(iii) ඝනඅපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2009 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලැබුණු රු.1,484,376ක් සහ සභා අරමුදලින් රු.94,915ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානවන විටත් කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණි.

**(ඇ) <u>තිරසාර සංවර්ධන ඉලක්ක</u>**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහාවන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහාවන දිගුකාලීන සැලසුම් 2018 මැයි 28 දින වනවිටත් සකස්කර නොතිබුණි.

## 3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩකාමර 02ක් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය මත අඩු ආදායම්ලාභී පුද්ගලයන් දෙදෙනකුට ලබාදීම සඳහා තීරණයකර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම කඩකාමර කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(xi) හා 19 (xii) වගන්ති ප්‍රකාරව සභාව සතු ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් වර්ෂ 03කට වැඩි කාලයක් කුලියට හෝ බද්දට දීමේදී අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගතයුතු වූවද එවැනි අනුමැතියක් නොලබා සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩකාමර 05ක් වර්ෂ 15ක කාලයක් සඳහා බදුදී තිබුණි.

(ඇ) බදු කාල සීමාව නිශ්චිතව සඳහන් නොකර බදුකරුවන් සමඟ ගිවිසුම්ගතවී තිබුණු කඩකාමර 181ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අදාල අඩුපාඩු නිවැරදිකර නැවත ගිවිසුම්ගතවීමට කටයුතුකර නොතිබුණි.

## 3.3 <u>වත්කම් කළමනාකරණය</u>

### 3.3.1 <u>පවරා නොගත් වත්කම්</u>

සුසාන භූමි 50ක අයිතිය පවරාගැනීමට කටයුතුකර නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

**3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) සභා අරමුදලින් සිදුකරනු ලබන කර්මාන්ත සඳහා සාධ්‍යාතා වාර්තාවක් සකස්කර නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 2017 නොවැම්බර් දින රහිත අංක 12/3/10/07 දරන ලිපිය අනුව සභාව විසින් ඉටුකරන ලද ව්‍යාපෘති මගින් ප්‍රතිලාභී ජනතාවගේ අපේක්ෂාවන් ඉටු වන්නේද සහ නඩත්තු කටයුතු සිදු කිරීම පිළිබඳව පසු විපරම් කළයුතු වුවද ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

**04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස උපයෝගීකරගෙන නොතිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණවත් පරිදි පවත්වා නොතිබුණි.

**05. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | (i) | කාර්ය මණ්ඩලය අනුමතකර නොගැනීම |
| | | (ii) | නිත්‍ය තනතුරට අදාල නොවන රාජකාරී පැවරීම |

| | | |
|---|---|---|
| (ඇ) | ව්‍යාපෘති | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම |
| (ඈ) | ආදායම් පරිපාලනය | ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන නොයාම |
| (ඉ) | වත්කම් පාලනය | සභාව සතු ඉඩම් පවරා ගැනීමට කටයුතු නොකිරීම |